ශීර්ෂය 007 - අධිකරණ සේවා කොමිෂන් සභාව - 2024

1. මූල්‍ය ප්‍රකාශන

1.1 මතය

ශීර්ෂය 007 - අධිකරණ සේවා කොමිෂන් සභාවේ 2024 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශය, එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය කාර්යසාධන ප්‍රකාශය හා මුදල් ප්‍රවාහ ප්‍රකාශවලින් සමන්විත 2024 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ විධිවිධාන සමග සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 11(1) වගන්තිය ප්‍රකාරව අධිකරණ සේවා කොමිෂන් සභාවේ මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් ඇතුළත් සම්පිණ්ඩන වාර්තාව 2025 මැයි 30 දින ප්‍රධාන ගණන්දිමේ නිලධාරි වෙත නිකුත්කරන ලදී. විගණන පනතේ 11(2) වගන්තිය ප්‍රකාරව කොමිෂන් සභාවට අදාළ වාර්ෂික විස්තරාත්මක කළමනාකරණ විගණන වාර්තාව 2025 අගෝස්තු 14 දින ප්රධාන ගණන්දීමේ නිලධාරි වෙත නිකුත් කරන ලදී. ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(6) ව්‍යවස්ථාව සමග සංයෝජිතව කියවිය යුතු 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 10 වගන්තිය ප්‍රකාරව මෙම වාර්තාව පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කරනු ලැබේ.

අධිකරණ සේවා කොමිෂන් සභාවේ 2024 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශනවලින්, මූල්‍ය තත්ත්වය, මූල්‍ය කාර්යසාධනය හා මුදල් ප්‍රවාහ, මූල්‍ය ප්‍රකාශනවලට අදාළ සටහන් 1හි සඳහන් මූල්‍ය ප්‍රකාශන සකස්කිරීමේ පදනමට අනුකූලව සියලුම ප්‍රමාණාත්මකතාවයන් සම්බන්ධයෙන් සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

1.2 මතය සඳහා පදනම

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර) අනුකූලව මා විගණනය සිදුකරන ලදී. මෙම විගණන ප්‍රමිති යටතේ වූ මාගේ වගකීම, මෙම වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම යන කොටසේ තවදුරටත් විස්තරකර ඇත. මාගේ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

1.3 කරුණක් අවධාරණය කිරීම - මූල්‍ය ප්‍රකාශන සකස්කිරීමේ පදනම

මෙම මූල්‍ය ප්‍රකාශන සකස්කිරීමේ පදනම විස්තර කරන මූල්‍ය ප්‍රකාශනවලට අදාළ සටහන් 1 කෙරෙහි අවධානය යොමු කරවමි. මූල්‍ය ප්‍රකාශන රජයේ මුදල් රෙගුලාසි 150 හා 151 සහ 2025 පෙබරවාරි 21 දින සංශෝධිත 2024 දෙසැම්බර් 16 දිනැති රාජ්‍ය ගිණුම් මාර්ගෝපදේශ අංක 06/2024 අනුව අධිකරණ සේවා කොමිෂන් සභාවේ, මහභාණ්ඩාගාරයේ සහ පාර්ලිමේන්තුවේ අවශ්‍යතාවය සඳහා සකස්කර ඇත. එමනිසා, මෙම මූල්‍ය ප්‍රකාශන වෙනත් අරමුණු සඳහා සුදුසු නොවිය හැක. මගේ වාර්තාව අධිකරණ සේවා කොමිෂන් සභාව, මහභාණ්ඩාගාරයේ සහ ශ්‍රී ලංකා පාර්ලිමේන්තුවේ භාවිතය සඳහා පමණක් අරමුණුකර ඇත. මෙම කරුණ සම්බන්ධයෙන් මගේ මතය විකරණය කරනු නොලැබේ.

1.4 මූල්‍ය ප්‍රකාශය සම්බන්ධයෙන් ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ හා ගණන්දීමේ නිලධාරීගේ වගකීම

රජයේ මුදල් රෙගුලාසි 150 හා 151 සහ 2025 පෙබරවාරි 21 දින සංශෝධිත 2024 දෙසැම්බර් 16 දිනැති රාජ්‍ය ගිණුම් මාර්ගෝපදේශ අංක 06/2024 අනුකූලව සියලුම ප්‍රමාණාත්මකතාවයන් සම්බන්ධයෙන් සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කෙරෙන පරිදි මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම හා වංචා සහ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍ය වන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ වගකීම වේ.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) වගන්තිය ප්‍රකාරව කොමිෂන් සභාව විසින් වාර්ෂික හා කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසිපරිදි පොත්පත් හා වාර්තා පවත්වා ගෙන යා යුතු ය.

ජාතික විගණන පනතේ 38(1)(ඇ) උපවගන්තිය ප්‍රකාරව කොමිෂන් සභාවේ මූල්‍ය පාලනය සඳහා සඵලදායි අභ්‍යන්තර පාලන පද්ධතියක් සකස්කර පවත්වාගෙන යනු ලබන බවට ප්‍රධාන ගණන්දීමේ නිලධාරී සහතික විය යුතු අතර, එම පද්ධතියේ සඵලදායිත්වය පිළිබඳව කළින් කළ සමාලෝචනයක් සිදුකර ඒ අනුව පද්ධතිය ඵලදායි ලෙස කරගෙන යාමට අවශ්‍ය වෙනස්කම් සිදුකරනු ලැබිය යුතු ය.

1.5 මූල්‍ය ප්‍රකාශන විගණනය පිළිබඳ විගණකගේ වගකීම

සමස්තයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා හා වැරදි හේතුවෙන් ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණන වාර්තාව නිකුත්කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදුකිරීමේ දී එය සැමවිටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන් අනාවරණයකර ගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවිය හැකි අතර, එහි ප්‍රමාණාත්මකභාවය මෙම මූල්‍ය ප්‍රකාශන පදනම්කර ගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම මත රඳා පවතී.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනයේ කොටසක් ලෙස මා විසින් විගණනයේ දී වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසු බවින් යුතුව ක්‍රියාකරන ලදී. මා විසින් තවදුරටත්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයාගැනීමේ දී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන් ඇතිවීමේ අවදානම් හඳුනාගැනීම හා තක්සේරු කිරීම සඳහා අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම්කර ක්‍රියාත්මක කරන ලදී. වරදවා දැක්වීම් හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබලවන්නේ ඒවා දුස්සන්ධානයෙන්, ව්‍යාජ ලේඛන සැකසීමෙන්, චේතනාන්විත මගහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මගහැරීමෙන් වැනි හේතු නිසා වන බැවිනි.

- අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවුව ද, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබාගන්නා ලදී.

- හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය සහ අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණ අයුරින් මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත් බව ඇගැයීම.

- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව සහ හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ත ඉදිරිපත් කිරීම අගයන ලදී.

මාගේ විගණනය තුළ දී හඳුනාගත් වැදගත් විගණන සොයාගැනීම්, ප්‍රධාන අභ්‍යන්තර පාලන දුර්වලතා හා අනෙකුත් කරුණු පිළිබඳව ප්‍රධාන ගණන්දීමේ නිලධාරී දැනුවත් කරමි.

2. වෙනත් නෛතික අවශ්‍යතා පිළිබඳ වාර්තාව

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6(1)(ඇ) වගන්තිය ප්‍රකාරව පහත සඳහන් කරුණු මා ප්‍රකාශ කරමි.

(අ) මූල්‍ය ප්‍රකාශන ඉකුත් වර්ෂය සමග අනුරූප වන බවට,

(ආ) ඉකුත් වර්ෂයට අදාළ මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මා විසින් කර තිබුණු නිර්දේශ ක්‍රියාත්මකකර තිබුණි.

3. මූල්‍ය සමාලෝචනය

3.1 වියදම් කළමනාකරණය

	විගණන නිරීක්ෂණය	ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම	නිර්දේශය
(අ)	ප්‍රමාණවත් පරිදි වාර්ෂික ඇස්තමේන්තු ප්‍රතිපාදන වෙන්කර නොගැනීම නිසා පුනරාවර්තන වැය විෂයන් 8කට හා මූලධන වැය විෂයන් 02ක් සඳහා ප්‍රතිපාදන රු.78,160,000කින් රු.63,196,084ක් ඉතිරිව තිබූ අතර, එම ඉතිරිවීම් සියයට 28 සිට සියයට 98ක පරාසයක් ගෙන තිබුණි.	ලිපිද්‍රව්‍ය අරපිරිමැසුම්දායී ලෙස භාවිතා කිරීම, අක්මුදල් නොලැබීම, කාර්යමණ්ඩලය බඳවාගෙන නොතිබීම හා වියදම් කළමනාකරණය, ජොෂ්ඨ සහකාර ලේකම්තුමෙකු ස්ථානමාරුවීම් ලැබීමෙන් අලුත්වැඩියා වියදම් ඉතිරිවීම, වර්ෂයේ ඇතැම් අලුත්වැඩියාවන්ට අදාළ ඉන්වොයිස් නොලැබීම, ස්ථානමාරුවීම් ලැබීමෙන් අලුත්වැඩියා වියදම් ඉතිරි වීම, රජයේ වියදම් කළමනාකරණය යටතේ වියදම් දැඩි ලෙස පාලනයට ලක්කිරීම, බඳවාගැනීමේ විභාග කටයුතු නොපැවැත්වීම හා ප්‍රසම්පාදන දුර්වලතා පැවතීම.	අවශ්‍යතා හඳුනාගෙන ඇස්තමේන්තු සකස්කළ යුතු වීම.
(ආ)	ප්‍රමාණවත් අයුරින් අවශ්‍යතා හඳුනානොගෙන ප්‍රතිපාදන වෙන්කර ගැනීම නිසා, වැය විෂයන් 02 සඳහා වන මුළු ඇස්තමේන්තු ප්‍රතිපාදනයම උපයෝජනය නොකර ඉතිරිව තිබුණි.	අයවැය ඇස්තමේන්තු සකස්කරන අවස්ථාවේ දී, අලුත්වැඩියා කරන ලද ගොඩනැගිල්ල වෙත මෙම කාර්යාලය රැගෙන යාමට නොහැකි වීම හා දැනට තාවකාලිකව කාර්යාලය පවත්වාගෙන යන ස්ථානයේ මහජනතාවට රැඳී සිටීමට ආවරණයක් සකසාගැනීම පිළිබඳව අවශ්‍යතාව හඳුනාගන්නා ලද	අවශ්‍යතා හඳුනාගෙන ඇස්තමේන්තු සකස්කළ යුතු වීම.

		නමුත්, ඒ සඳහා ප්‍රතිපාදන ප්‍රමාණවත් නොවීම හා 2104 වැය විෂය සඳහා රජයේ වියදම් කළමනාකරණය යටතේ වියදම් දැඩි ලෙස පාලනයට ලක්කිරීම සහ බඳවාගැනීම් සීමා කිරීම නිසා ඒ හා සම්බන්ධ පුහුණු වැඩසටහන් සීමාවීම.	

3.2 ප්‍රධාන ගණන්දීමේ නිලධාරී/ගණන්දීමේ නිලධාරී විසින් සිදුකළ යුතු සහතිකවීම්

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 38 වන වගන්තියේ විධිවිධාන අනුව ප්‍රධාන ගණන්දීමේ නිලධාරී විසින් පහත සඳහන් කරුණු සම්බන්ධයෙන් සහතිකවීම් කළ යුතුව තිබුණත්, ඒ අනුව කටයුතු කර නොතිබුණි.

	විගණන නිරීක්ෂණය	**ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම**	**නිර්දේශය**
(අ)	කොමිෂන් සභාවේ මූල්‍ය පාලනය සඳහා සඵලදායි අභ්‍යන්තර පාලන පද්ධතියක් සකස්කර පවත්වාගෙන යනු ලබන බවට ප්‍රධාන ගණන්දීමේ නිලධාරී හා ගණන්දීමේ නිලධාරී සහතික විය යුතු අතර, එම පද්ධතියේ සඵලදායිතාවය පිළිබඳව කලින් කළ සමාලෝචනය සිදු කර ඒ අනුව පද්ධති ඵලදායි ලෙස කර ගෙන යැමට අවශ්‍ය වෙනස්කම් සිදු කරනු ලැබිය යුතු බවත්, එම සමාලෝචනයන් ලිඛිතව සිදුකර එහි පිටපතක් විගණකාධිපති වෙත ඉදිරිපත් කළ යුතුව තිබුණත්, එවැනි සමාලෝචනයන් සිදුකළ බවට ප්‍රකාශ විගණනයට ඉදිරිපත්කර නොතිබුණි.	අධිකරණ සේවා කොමිෂන් සභාවේ සඵලදායී අභ්‍යන්තර පාලන පද්ධතියක් සහතිකකිරීම උදෙසා අවශ්‍ය අවස්ථාවන්හි දී සමාලෝචනයන් සිදුකරන අතර, 2024 වර්ෂයේ දී මු.රෙ.135 අනුව සංශෝධිත වියදම් පිළිබඳ බලය පැවරීම මේ සමග ඉදිරිපත් කරමි.	2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 38 වගන්තියේ විධිවිධාන ප්‍රකාරව කටයුතු කළ යුතුවීම.
(ආ)	වාර්ෂික සහ වෙනත් මූල්‍ය ප්‍රකාශ අවශ්‍ය වේලාවන් ඇතුළත පිළියෙලකිරීම සිදු වන බවට ප්‍රධාන ගණන්දීමේ නිලධාරී හා ගණන්දීමේ නිලධාරී විසින් සහතික විය යුතු අතර, ඊට අමතරව විගණනය කරනු ලබන ආස්ථිත්‍යයට අදාළ වාර්ෂික වාර්තා පාර්ලිමේන්තුවට ඉදිරිපත් කිරීමට ප්‍රධාන ගණන්දීමේ නිලධාරී වගබලාගත යුතු වුවත්, වාර්තාවේ 4.1 ඡේදයේ සඳහන් විගණන නිරීක්ෂණ හේතුවෙන් එම අවශ්‍යතා ඉටුකර නොතිබුණි.	අධිකරණ සේවා කොමිෂන් සභාවේ වැඩ කටයුතුවල ස්වභාවය අනුව සහ පවතින සීමිත නිලධාරී සංඛ්‍යාව අනුව 2023 වර්ෂයට අයත් කාර්යසාධන වාර්තාව පාර්ලිමේන්තුවට ඉදිරිපත් කිරීමට අවශ්‍ය කටයුතු සිදුකෙරෙමින් පවතී. 2024 වර්ෂයට අයත් කාර්යසාධන වාර්තාව මේ වන විට සකස්කර අවසන් අතර, එහි පරිවර්තන කටයුතු සිදුකෙරෙමින් පවතී.	2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 38 වගන්තියේ විධිවිධාන ප්‍රකාරව කටයුතු කළ යුතුවීම.

(ඇ)	අභ්‍යන්තර විගණන කර්තව්‍ය නිසිපරිදි ක්‍රියාත්මක කිරීම සඳහා ඵලදායි ක්‍රමවේදයක් ඇති බවට ප්‍රධාන ගණන්දීමේ නිලධාරී හා ගණන්දීමේ නිලධාරී සහතික විය යුතු වුවත්, වාර්තාවේ 6.2 ඡේදයේ සඳහන් නිරීක්ෂණ අනුව එම අවශ්‍යතාවය ඉටු කර නොතිබුණි.	කොමිෂන් සභාව සඳහා අභ්‍යන්තර විගණන ඒකකයක් පිහිටුවීම සඳහා කාර්යමණ්ඩලය අනුමතකර ඇත. නමුත් අධිකරණ සේවා කොමිෂන් සභාවේ කටයුතු තාවකාලික ගොඩනැගිල්ලක පවත්වාගෙන යන බැවින්, ඉහත අනුමතකර ඇති කාර්යමණ්ඩලය සඳහා ප්‍රමාණවත් ඉඩකඩ නොමැති වීම හේතුවෙන් අභ්‍යන්තර විගණන ඒකකයක් පිහිටුවා නැත.	2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 38 වගන්තියේ විධිවිධාන ප්‍රකාරව කටයුතු කළ යුතුවීම.

3.3 නීතිරීති හා රෙගුලාසිවලට අනුකූල නොවීම

නියැදි විගණන පරීක්ෂණවල දී නිරීක්ෂණය වූ නීතිරීති හා රෙගුලාසිවල විධිවිධානවලට අනුකූල නොවූ අවස්ථා පහත විග්‍රහකර දැක්වේ.

	නිරීක්ෂණය			**ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම**	**නිර්දේශය**
	නීතිරීති හා රෙගුලාසි වලට යොමුව	**වටිනාකම රු.**	**අනුකූල නොවීම**		
(අ)	ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි සංග්‍රහය - 237 (ආ)	425,027	ගබඩා සැපයුම් සඳහා ගෙවීම් කිරීමේ දී භාණ්ඩ ලැබී ඇති බවට ද, අදාළ බඩු ලේඛනයෙහි තොග පොත යනාදියෙහි එකී භාණ්ඩ ඇතුළත්කර ඇති බවට ද, සහතිකයක් ඇමිණිය යුතු වුවත්, මිලදීගැනීම් 02කට අදාළව එසේ සිදුකර නොතිබුණි.	භාණ්ඩ ලැබී ඇති බවට වෙනම සහතිකයක් අමුණා නොමැති අතර, අදාළ බිල්පත්වල ගෙවීම් කරන අවස්ථාව වන විටත්, අදාළ සහතිකවීම සටහන්කර තිබේ.	මුදල් රෙගුලාසි ප්‍රකාරව කටයුතු කළ යුතුවීම.
(ආ)	**රාජ්‍ය මුදල් චක්‍රලේඛ**				
	(i) 2020 අගෝස්තු 28 දිනැති අංක 01/2020 දරන චක්‍රලේඛයේ 11.1 වගන්තිය	-	2022 සහ 2023 වර්ෂවල භාණ්ඩ සමීක්ෂණය සිදුකර අවසන් කිරීමේ කාලරාමුව තුළ කටයුතු කළ යුතු වුවත්, ඊට අනුකූල නොවන ලෙස කටයුතුකර තිබුණි.	2022 වර්ෂය හා 2023 වර්ෂයට අදාළ භාණ්ඩ සමීක්ෂණ අදාළ කාලරාමුව තුළ ප්‍රමාදයකින් තොරව සිදුකිරීමට කටයුතු කරන බව දන්වමි.	චක්‍රලේඛය පරිදි අදාළ කාලපරිච්ඡේදය තුළ භාණ්ඩ සමීක්ෂණ කටයුතු කළ යුතුවීම.

(ii)2022 අගෝස්තු 28 දිනැති අංක 02/2020 දරන චක්‍රලේඛයේ 10.2 ඡේදය	-	2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(2) වගන්තිය ප්‍රකාර 2024 වාර්ෂික මූල්‍ය ප්‍රකාශන සමග ඉදිරිපත් කළ යුතු කෙටුම්පත් වාර්ෂික කාර්යසාධන වාර්තාව මූල්‍ය ප්‍රකාශන සමග ඉදිරිපත්කර නොතිබුණි.	අධිකරණ සේවා කොමිෂන් සභාවේ වැඩ කටයුතුවල ස්වභාවය අනුව සහ පවතින සීමිත නිලධාරී සංඛ්‍යාව අනුව 2024 වර්ෂයට අයත් කාර්යසාධන වාර්තාව මේ වන විට සකස්කර අවසන්කර ඇති අතර, ඔබ වෙත ඉදිරිපත් කිරීමට මේ වන විට අවශ්‍ය කටයුතු සිදු කෙරෙමින් පවතී.	චක්‍රලේඛය පරිදි කෙටුම්පත් වාර්ෂික කාර්යසාධන වාර්තාව ඉදිරිපත් කළ යුතුවීම.

4. මෙහෙයුම් සමාලෝචනය

4.1 වාර්ෂික කාර්යසාධන වාර්තාව

විගණන නිරීක්ෂණය	ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම	නිර්දේශය
2020 අගෝස්තු 28 දිනැති අංක 02/2020 දරන රාජ්‍ය මුදල් චක්‍රලේඛයේ 12.1 ඡේදය ප්‍රකාරව වාර්ෂික කාර්යසාධන වාර්තාව මුදල් වර්ෂය අවසාන වී දින 150ක් ගතවීමට ප්‍රථම සභාගතකිරීම සඳහා පාර්ලිමේන්තුවට ඉදිරිපත් කළ යුතු වුවත්, 2022 වර්ෂයේ කාර්යසාධන වාර්තාව දින 555ක කාලප්‍රමාදයක් සහිතව 2024 දෙසැම්බර් 05 දින පාර්ලිමේන්තුව වෙත සභාගත කිරීම සඳහා ඉදිරිපත්කර තිබුණි. එමෙන්ම 2023 වර්ෂයේ කාර්යසාධන වාර්තාව 2025 ජූලි 01 වන දින දින 396ක ප්‍රමාදයක් සහිතව පාර්ලිමේන්තුව වෙත සභාගතකිරීම සඳහා ඉදිරිපත්කර තිබුණි.	2023 වර්ෂයේ කාර්යසාධන වාර්තාව මේ වන විට පාර්ලිමේන්තුවට ඉදිරිපත් කිරීමට අවශ්‍ය කටයුතු සිදු කෙරෙමින් පවතී. අධිකරණ සේවා කොමිෂන් සභාවේ වැඩ කටයුතුවල ස්වභාවය අනුව සහ පවතින සීමිත නිලධාරී සංඛ්‍යාව අනුව 2024 වර්ෂයට අයත් කාර්යසාධන වාර්තාව මේ වන විට සකස්කර අවසන්කර ඇති අතර, ඔබ වෙත ඉදිරිපත් කිරීමට මේ වන විට අවශ්‍ය කටයුතු සිදුකෙරෙමින් පවතී.	චක්‍රලේඛ හා ජාතික විගණන පනත ප්‍රකාරව කටයුතු කළ යුතු වීම.

4.2 ප්‍රසම්පාදනයන්

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

	විගණන නිරීක්ෂණය	ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම	නිර්දේශය
(අ)	රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ ඡේද 4.2.2(අ) ඡේදය ප්‍රකාරව ප්‍රසම්පාදනයන් ආරම්භවීමේ අවස්ථාවේ සිට අවසන්කරන තුරු එක් එක් ප්‍රසම්පාදනය ක්‍රියාවන්හි පියවර කාලක්‍රමානුගතව විස්තර කරන ලේඛනයක් සකස්කළ යුතු වුවත්, කොමිෂන් සභාව විසින් එවැනි ලේඛනයක් පිළියෙලකර නොතිබුණි.	ප්‍රායෝගික හේතූන් මත ප්‍රසම්පාදනයට අදාළ එක් එක් පියවරයන්වලට අදාළ දින වකවානු නිරන්තරයෙන් වෙනස් වන බැවින් ප්‍රසම්පාදන සැලැස්ම වර්ෂය පුරාවටම දිගින් දිගටම වෙනස් කළ යුතු බැවින්, ඒ ඒ ප්‍රසම්පාදනය ආරම්භ වන අවස්ථාවේ දී ප්‍රසම්පාදන ක්‍රියාවලියේ පියවර සහිතව විස්තරාත්මක ප්‍රසම්පාදන සැලැස්මක් 2025 වර්ෂයේ සිට පිළියෙළ කිරීම සිදුකරනු ලැබේ.	ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහය ප්‍රකාරව කටයුතු කළ යුතු වීම.
(ආ)	ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ ඡේද 4.2.1 ප්‍රකාරව අවම වශයෙන් වසර 03ක කාලයක් සඳහා අපේක්ෂිත ප්‍රසම්පාදන කටයුතු ඇතුළත් ප්‍රධාන ප්‍රසම්පාදන සැලැස්මක් පිළියෙල කළ යුතු නමුත්, කොමිෂන් සභාව විසින් එවැනි ප්‍රධාන ප්‍රසම්පාදන සැලැස්මක් පිළියෙලකර නොතිබුණි.	වසර තුනක කාලයක් සඳහා අපේක්ෂිත ප්‍රසම්පාදන කටයුතු ඇතුළත් ප්‍රධාන ප්‍රසම්පාදන සැලැස්මක් පිළියෙළ කිරීම ඉදිරි වර්ෂයේ සිට සිදුකරනු ලැබේ.	ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහය ප්‍රකාරව කටයුතු කළ යුතු වීම.

5. තිරසර සංවර්ධන අරමුණු ළඟාකර ගැනීම

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

විගණන නිරීක්ෂණය	ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම	නිර්දේශය
2018 අප්‍රේල් 27 දිනැති අංක එම්එස්ඩීඩබ්/08/65 දරන තිරසර සංවර්ධන හා වනජීවී අමාත්‍යාංශය විසින් නිකුත්කරන ලද ලිපිය ප්‍රකාරව ආයතනය විසින් 2022 වර්ෂය සඳහා තිරසර සංවර්ධන අරමුණු හා දර්ශක හඳුනාගෙන එම තිරසර සංවර්ධන අරමුණු ඉටුකර ගැනීම සම්බන්ධීකරණය කිරීමට නිලධාරීන් පත්කොට තිරසර සංවර්ධන වැඩසටහනක් පිළියෙල කිරීමට කටයුතු කරමින් පවතින බව දක්වා තිබුණ ද, එවැනි වැඩසටහනක් පිළියෙලකර නොතිබුණි.	දෙපාර්තමේන්තුව විසින් 2022 වර්ෂය සඳහා සංවර්ධන අරමුණු හා දර්ශක හඳුනාගෙන එම තිරසර සංවර්ධන අරමුණු ඉටුකර ගැනීම සම්බන්ධීකරණය කිරීමට නිලධාරීන් පත්කොට තිරසර සංවර්ධන වැඩසටහනක් පිළියෙල කිරීම සඳහා කටයුතු කරමින් පවතී.	තිරසර සංවර්ධන වැඩසටහන් පිළියෙලකර ක්‍රියාත්මක කළ යුතුවීම.

6. යහපාලනය

6.1 මහජනයා වෙත සේවා ඉටුකිරිම

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

විගණන නිරීක්ෂණය	ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම	නිර්දේශය
2008 පෙබරවාරි 06 දිනැති අංක 05/2008 සහ 2018 ජනවාරි 24 දිනැති අංක 05/2008(I) දරන රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ ප්‍රකාරව රාජ්‍ය අංශයේ ක්‍රියාකාරකම් වඩාත් කාර්යක්ෂම කිරීමට සහ ඒ සඳහා සම්බන්ධවන්නා වූ පාර්ශවයන් අතර මනාඅවබෝධයක් සහ එකිනෙකා අතර විශ්වාසය වැඩිදියුණු කිරීමට පුරවැසි/සේවාලාභී ප්‍රඥප්තිය හඳුන්වාදීම සෑම රාජ්‍ය ආයතනයක් විසින්ම සිදුකළ යුතුව තිබුණ ද, කොමිෂන් සභාව විසින් එවැනි පුරවැසි/සේවාලාභී ප්‍රඥප්තියක් හඳුන්වාදීම සිදුකර නොතිබුණි.	2008 පෙබරවාරි 06 දිනැති සහ 2018 ජනවාරි 24 දිනැති පිළිවෙළින් අංක 05/2008 සහ 05/2008 (i) දරන රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ ප්‍රකාරව පුරවැසි/සේවාලාභී ප්‍රඥප්තිය හඳුන්වා දීමට කටයුතු කරමින් පවතී.	චක්‍රලේඛය ප්‍රකාරව කටයුතු කළ යුතුවීම.

6.2 අභ්‍යන්තර විගණනය

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

විගණන නිරීක්ෂණය	ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම	නිර්දේශය
2018 අංක 19 දරන ජාතික විගණන පනතේ ඡේද අංක 40(1) ප්‍රකාරව කොමිෂන් සභාව අභ්‍යන්තර විගණන කටයුතු සිදුකිරීම සඳහා එම කොමිෂන් සභාවේ පාලක මණ්ඩලය විසින් පත්කරනු ලබන තමාගේම අභ්‍යන්තර විගණකවරයෙකු සිටිය යුතු නමුත්, කොමිෂන් සභාවේ අනුමත කාර්යමණ්ඩලය තුළ අභ්‍යන්තර විගණක තනතුරක් ඇතුළත්කර තිබුණ ද, එම තනතුර පුරප්පාඩුව පැවතුණි. තව ද, 2019 ජනවාරි 12 දිනැති අංක DMA/01-2019 දරන කළමනාකරණ විගණන චක්‍රලේඛයෙහි 03 ඡේදය ප්‍රකාරව ප්‍රධාන ගණන්දීමේ නිලධාරියාගේ	කොමිෂන් සභාව සඳහා අභ්‍යන්තර විගණන ඒකකයක් පිහිටුවීම සඳහා කාර්යමණ්ඩලය අනුමතකර ඇත. නමුත් අධිකරණ සේවා කොමිෂන් සභාවේ කටයුතු තාවකාලික ගොඩනැගිල්ලක පවත්වාගෙන යන බැවින්, ඉහත අනුමතකර ඇති කාර්යමණ්ඩලය සඳහා ප්‍රමාණවත් ඉඩකඩ නොමැතිවීම හේතුවෙන් අභ්‍යන්තර විගණන ඒකකයක් පිහිටුවා නැත.	විගණන පනත හා චක්‍රලේඛය ප්‍රකාරව කටයුතු කළ යුතුවීම.

සෑජු අධීක්ෂණය යටතේ ශ්‍රී ලංකා ගණකාධිකාරී සේවයේ I පන්තිය නිලධාරියෙකුගේ ප්‍රධානත්වය දරන අභ්‍යන්තර විගණන අංශයක් සියලුම විශේෂ වියදම් ඒකක සඳහා ස්ථාපිත කළ යුතු නමුත්, කොමිෂන් සභාව තුළ අභ්‍යන්තර විගණන අංශයක් ස්ථාපිතකර නොතිබුණි.

7. මානව සම්පත් කළමනාකරණය

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

	විගණන නිරීක්ෂණය	ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම	නිර්දේශය
(අ)	සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට කොමිෂන් සභාව සඳහා අනුමත කාර්යමණ්ඩලය 117ක් වුව ද, එදිනට තනතුරු 14ක සේවකයන් 82ක ඌණතාවයක් ද, තනතුරු 08ක සේවකයන් 29ක අතිරික්තයක් ද පැවතුණි. ඒ අනුව කොමිෂන් සභාවේ කාර්යමණ්ඩලය වර්තමාන තත්ත්වයට අනුව සකස්කර ගැනීමට හෝ අනුමත තනතුරු සම්පූර්ණකර හෝ අතිරික්ත තනතුරු අනුමතකර ගැනීමට කටයුතුකර නොතිබුණි.	අධිකරණ සේවා කොමිෂන් සභාවේ කටයුතු දැනට සිටින කාර්යමණ්ඩලය ද ප්‍රමාණවත් නොවන තාවකාලික ගොඩනැගිල්ලක පවත්වාගෙන යන අතර, අනුමත සංඛ්‍යාව ඉක්මවා සිටින තනතුරු 08ක නිලධාරීන් 29දෙනා මගින් දැනට පුරප්පාඩුව පවතින තනතුරු 14 ක නිලධාරීන් 82කගේ රාජකාරී කටයුතු පූරණයකර ගැනීමට කටයුතුකර ඇත. අනුමත කාර්ය මණ්ඩලය 117ක් වුව ද, නිලධාරීන් 64 දෙනෙකු වැනි අවම සංඛ්‍යාවකින් අධිකරණ සේවා කොමිෂන් සභාවේ නියෝග පරිදි සම්පූර්ණ අධිකරණ පද්ධතියේම අධීක්ෂණය, මෙහෙයවීම සහ පරිපාලනයට අදාළ සියලු කටයුතු මෙම ලේකම් කාර්යාලය මගින් නිසි පරිදි පවත්වාගෙන යනු ලැබේ.	කාර්යමණ්ඩල පුරප්පාඩු සම්පූර්ණකර ගැනීමට කටයුතු කළ යුතුවීම.
(ආ)	අනුමත කාර්යමණ්ඩලය තුළ නොමැති අධිකරණ රෙජිස්ට්‍රාර් තනතුරු (Courts Registrar) 03ක් SL 1 වැටුප් තලයෙහි ද, එක් අධිකරණ රෙජිස්ට්‍රාර් (Courts Registrar) තනතුරක් MN 7 වැටුප් තලයෙහි ද, පිහිටුවා තිබුණි.	අධිකරණ පද්ධතියේ අධීක්ෂණය, මෙහෙයවීම සහ පරිපාලනය පිළිබඳ දැනුම සහ පළපුරුද්ද අධිකරණ රෙජිස්ට්‍රාර්වරුන් සතුව පවතින බැවින්, එම තනතුර කළමනාකරණ සේවා දෙපාර්තුමේන්තුව මගින් අනුමතකර ගැනීම සඳහා අවශ්‍ය පියවරගනිමින් පවතී.	අදාළ තනතුර කළමනාකරණ සේවා දෙපාර්තමේන්තු ව මගින් අනුමතකර ගත යුතුවීම.

(ඇ)	අනුමත කාර්යමණ්ඩලය තුළ MN 7 වැටුප් තලයෙහි අධිකරණ ලඝුලේඛක (Court Stenographer) තනතුරක් අනුමත කිරීමකින් තොරව බඳවාගැනීම් සිදුකර තිබුණි.	අධිකරණ සේවා කොමිෂන් සභාවේ කාර්යභාරයන් අතර සමස්ත අධිකරණ පද්ධතියේම විමර්ශන කටයුතු සිදු කිරීම ප්‍රධාන ස්ථානයක් ගනු ලබයි. මෙම කාර්යාලයේ විශ්වාසවන්ත භාවයට ගැළපෙන අයුරින් සේවය කිරීමට සුදුසු පළපුරුදු නිලධාරියෙකු ලබාගන්නා තෙක් (රාජ්‍ය සේවයට නව බඳවාගැනීම් අත්හිටුවා ඇති බැවින්) එම නිලධාරිනිය මගින් එම කාර්යය පූරණයකර ගැනීමට කටයුතුකර ඇත.	තනතුරු අනුමත කිරීමට කටයුතු කළ යුතුවීම.
(ඇ)	2018 ජනවාරි 24 දිනැති අංක 02/2018 දරන රාජ්‍ය පරිපාලන චක්‍රලේඛයේ 04 ඡේදය ප්‍රකාරව මානව සම්පත් සංවර්ධන සැලැස්මක් කොමිෂන් සභාව විසින් පිළියෙලකර නොතිබුණි.	නිසිපරිදි සකස්කරනු ලැබූ මානව සම්පත් සැලැස්මක් පිළියෙලකර නොතිබූ නමුත්, අධිකරණ රෙජිස්ට්‍රාර් සේවයේ සහ උපලේඛනගත රජයේ නිලධරයන්ගේ සේවාවේ සියලුම තනතුරුවල නිලධාරීන්ගේ කාර්ය සාධනය ඇගයීම සඳහා අධිකරණවල කාර්යක්ෂමතාවය සහ සඵලදායීතාවය ඉහළ නැංවීමට තුඩුදෙන වඩාත් ප්‍රායෝගික කාර්යසාධන ඇගයීම් ක්‍රමවේදයක් යෝජනා කිරීම යන අරමුණු ඔස්සේ සමාලෝචනයකර වාර්තාකිරීමට මේ වන විට කමිටුවක් පත්කර ඇති අතර, එහි කටයුතු අවසන් වූ පසු අදාළ නිර්දේශ අධිකරණ සේවා කොමිෂන් සභාව වෙත ඉදිරිපත්කර ඇත. ඒ අනුව සුදුසු ඉදිරි ක්‍රියාමාර්ග ගැනීමට නියමිත ය.	චක්‍රලේඛය පරිදි මානව සම්පත් සංවර්ධන සැලැස්ම පිළියෙල කිරීමට කටයුතු කළ යුතු වීම.